අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறிப்பு / My Ref.: PTF/01/Gen/01
ඔබේ යොමුව / உமது குறிப்பு / Your Ref.:
දිනය / திகதி / Date: 2020.05.04

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ**

**ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**විශ්‍රාමිකයින් සඳහා මැයි මස විශ්‍රාම වැටුප් ගෙවීම**

සියලුම රජයේ විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප සෑම මසකම 10වන දින ගෙවීමට නියමිතව ඇති වුව ද, වෙසක් පොහොය හා සති අන්ත නිවාඩු දිනයන් යෙදෙන බැවින් 2020 මැයි මස විශ්‍රාම වැටුප් ගෙවීම මැයි 05 සහ 06 යන දිනවල දී සිදු කිරීමට රජය තීරණය කර ඇත.

02. ඒ අනුව, විශ්‍රාමිකයින්ට පසුගිය අප්‍රේල් මස විශ්‍රාම වැටුප ලබා ගැනීමට රජය විසින් පහසුකම් සැලසූ ආකාරයටම මැයි මාසයේ ද දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මගපෙන්වීම යටතේ විශ්‍රාම වැටුප ලබා ගැනීමට කටයුතු සංවිධානය කළ යුතු ය.

03. තැපැල් දෙපාර්තමේන්තුව මඟින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයින්ට සිය විශ්‍රාම වැටුප පසුගිය අප්‍රේල් මස ලබා දුන් ආකාරයට නිවසටම ගෙනවිත් භාර දීම එම දෙපාර්තමේන්තුව මඟින් සිදු කිරීමට නියමිත ය.

04. බැංකු මාර්ගයෙන් විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයින්ට සිය විශ්‍රාම වැටුප, ග්‍රාම නිලධාරීන් ඇතුළු ග්‍රාමීය මට්ටමේ රාජකාරී කරන නිලධාරීන්ගේ සංවිධානයෙන් ත්‍රිවිධ හමුදාව සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමඟ එක්ව සෞඛ්‍ය අංශවල නිර්දේශ හා නියාමනයන්ට යටත්ව බැංකු වෙත යාමට අවශ්‍ය පහසුකම් සැලසිය යුතු වේ.

05. තවද, සියලුම විශ්‍රාමිකයින්ට අවශ්‍ය ඖෂධ ලබා ගැනීමට ඖෂධ අලෙවිසැල් (ෆාමසි) වෙත ගෙන යාමට සහ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට ආසන්නතම ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන කරා රැගෙන යාමට ද ඉහත පරිදි පහසුකම් සැලසිය යුතු වේ.

ඔබ විසින් 2020 අප්‍රේල් මස දීමනා ගෙවීම ඉතා ප්‍රශංසනීය අයුරින් ඉටුකළ බව නිරීක්ෂණය වූ බැවින්, 2020 මැයි මාසයේ දීමනා ගෙවීම් ද ඒ ආකාරයෙන්ම සිදු කරනු ඇතැයි උදක්ම අපේක්ෂා කරමි.

**ගාමිණී එස්. සෙනරත්**

අග්‍රාමාත්‍ය ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති

} අවශ්‍ය කටයුතු සඳහා

කාර්යාලය / அலுவலகம் / Gen. Office: 2575317, 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2574143, 2575454, 2575310
විද්‍යුත් තැපෑල / ஈ மெயில் / E-mail: secpm@pmoffice.gov.lk

| | |
|---|---|
| 4. ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>5. ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය<br>6. ලේකම් - සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය<br>7. ත්‍රිවිධ හමුදාපතිවරුන්<br>8. පොලිස්පති<br>9. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්<br>10. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්<br>11. තැපැල්පති | අවශ්‍ය කටයුතු සඳහා |
| 12. සභාපති, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | - ඉහත කාර්යයට රියදුරන් සහ ඉන්ධන සහිත වාහන ත්‍රිවිධ හමුදාවලට සැපයීම සඳහා |
| 13. සාමාන්‍යාධිකාරී- මහජන බැංකුව, ලංකා බැංකුව,ජාතික ඉතිරි කිරීමේ බැංකුව<br>14. ප්‍රධාන විධායක නිලධාරී - සියලුම පෞද්ගලික බැංකු | අවශ්‍ය කටයුතු සඳහා |